සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

# කොටස - I

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. ඊමානයේ වඩාත් වැදගත් වූ ද ප්‍රථම වූ ද අංගය වන්නේ,
   1. ඉබාදත් 2. රිසාලත් 3. තව්හීද් 4. මුආමලාත්

2. තමා ජීවත් ව සිට ඉස්ලාමය මැරී යෑමට වඩා ඉස්ලාමය ජීවත්ව සිට තමා මැරී යෑම උතුම් යැයි පැවසුවේ,
   1. උමර් රලියල්ලාහු අන්හු 2. අබූබක්කර් රලියල්ලාහු අන්හු
   3. ඉමාම් අහ්මද් බින් හම්බල් 4. අලි රලියල්ලාහු අන්හු

3. ගැටුම් කිසිවක් නොමැතිව නිවැරදි අකීදාව අනුගමනය කරන්නන්,
   1. අස්-සුන්නිවරු 2. අල් ජබරිවරු 3. මුඃතසිලාවරු 4. කාදිරියාවරු

4. පිරිසිදු කරන ක්‍රම අනුව නජීස් බෙදා ඇති වර්ග,
   1. 2 කි. 2. 4 කි. 3. 3 කි. 4. 5 කි.

5. අල්ලාහ්ට සම කරන ක්‍රියාවන් හි යෙදෙන්නන් හඟවන වචනය,
   1. මුර්තද් 2. මුෂ්රික් 3. මුනාෆික් 4. කාෆිර්

6. ශාස්ත්‍ර බැලීම මැතිරීම ආදිය,
   1. කබායිර් 2. ෂිර්ක් අක්බර් 3. ෂිර්ක් අස්කර් 4. කුෆ්ර්

7. ''උල්හියාව''සඳහා වයස් සීමාව,
   1. වසරක් සම්පූර්ණ වූ බැටළුවා 2. දෙවසර සම්පූර්ණ වූ බැටළුවා
   3. වසරක් සම්පූර්ණ වූ එළුවා 4. දෙවසර සම්පූර්ණ නොවූ බැටළුවා

8. ඉබාදතයේ කොටස් දෙක අතරින් එකකි. නැමදුම් පිළිවෙත් අනෙක,
   1. එදිනෙදා ක්‍රියාකාරකම් ය. 2. පස්වේලේ සලාතය
   3. සකාත් හා සදකා 4. සමාජ සේවා

9. සලාතයේ දී උසුරන අවසාන අත්තහියාතයේ දී නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමාට සලවාත් කීම,

1. සුන්නත් ය. 2. මුබාහ් ය. 3. ෆර්ල් ය. 4. මුස්තහබ් ය.

10. සුළු කිල්ලෙන් ඉවත් වීම සඳහා,

1. දිය නා ගත යුතුයි.
2. වුළූඃ කළ යුතුයි.
3. පස් මිශ්‍ර ජලයෙන් සේදිය යුතුයි.
4. 7 වරක් ඉතා පිරිසිදු ජලයෙන් සේදිය යුතුය.

11. ''නෆ්සුල් ලව්වාමා'' යනු,

1. පිරිසිදු සිත 2. තෘප්තිමත් සිත
3. රිදවා ගන්නා සිත 4. අයහපතට පොළඹවන සිත

12. අතපසු වුවහොත් කළ නොහැකි යාඥාව,

1. තහජ්ජත් 2. ඉෂා 3. විත්ර් 4. ජුම්ආ

13. සලාතය නොසැලකිල්ලෙන් හා විටින් විට ඉටු කළ තැනැත්තා,

1. සකර් 2. ලූලා 3. හයි 4. ජහන්නම්

14. වෙළෙඳ කටයුත්තක් නොවන්නේ,

1. මිල දී ගන්නා-විකුණන්නා 2. සාක්ෂි
3. වෙළෙඳ භාණ්ඩ 4. ඉජාබ්-කබූල්

15. දිනපතා 100 වාරයන් පාරායනය කිරීමෙන් සාගර පෙන මෙන් පව් සමාව ලැබෙන දික්රය,

1. ලාකූවත ඉල්ලා බිල්ලාහ්
2. සුබ්හානල්ලාහි වබිහම්දිහි
3. අල්ලාහු අක්බර්
4. ලායිලාහ ඉල්ලා අන්ත සුබ්හානක ඉන්නී කුන්තු මිනල්ලාලිමීන්

16. ඊමාන් හා කුෆ්ර් අතර වෙනස වන්නේ,

1. සකාත් දීමය. 2. හජ් ඉටුකිරීමය.
3. සලාත් ඉටුකිරීමය. 4. සව්ම් සමාදන්වීමය.

17. 'යමෙකු තම අවශ්‍යතාව අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා නොකරන්නේ ද අල්ලාහ් කෝපයට පත් වන්නේය' මෙය,

1. කුර්ආනයේ කියමනකි. 2. හදීසයකි.
3. උමර් රලියල්ලාහු අන්හු තුමාගේ ප්‍රකාශයකි. 4. ඉමාම් බුහාරි තුමාගේ ප්‍රකාශයකි.

18. ''මුජාහදතුන් නෆ්ස්'' යනු,

1. සිතින් කරන ජිහාදයකි. 2. ඉබාදතයකි.
3. ප්‍රාර්ථනාවකි. 4. නැමදුම් ක්‍රමයකි.

19. යකඩ භාවිතා කර විශාල බිත්ති බැඳීම සහ අළුත් නිර්මාණයන් කිරීමේ කාර්යයෙහි යෙදී සිටි පුද්ගලයා කවුද?,

1. ඉද්රීස් 2. දාවුද් 3. සුලෙයිමාන් 4.දුල් කර්නෙයින්

20. තරුණ ජීවිතය සම්බන්ධව ප්‍රකාශ කරන සූරාව වන්නේ,

1. සූරතුල් යාසීන් 2. සූරතුල් කෘෆ් 3. සූරතුල් බකරා 4. සූරතුල් යුසුෆ්

21. මිනිසා වැය කරන දිනාර්වලින් වැඩි ප්‍රයෝජනය ඇති ඒවා යැයි නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසුවේ,

1. අල්ලාහ්ගේ මාර්ගයේ වැය කරන දිනාරය.
2. මහලුන් නිදහස් කිරීම සඳහා වැය කරන දිනාරය.
3. දුප්පතුන්ට දීම සඳහා වැය කරන දිනාරය.
4. බිරිඳ හා දරුවන් වෙනුවෙන් වැය කරන දිනාරය.

22. කෙනෙකුට ණය දෙන විට සැලකිළිමත් විය යුතු කොන්දේසියක් නොවන්නේ,

1. මුස්ලිම්වරයෙකු වීම. 2. ලිඛිතව තිබීම. 3. සාක්ෂි කරුවන් සිටීම. 4. ඊජාබ්-කබූල්

23. මදීනාවේ ජීවත්වූ ගෝත්‍රයක් වන්නේ,

1. නුස්තින් 2. හබසි 3. කස්රජ් 4. කුරෛයිෂ්

24. මිනිසෙක් අධ්‍යාත්මිකව ජය ලැබීමට නම්,

1. මෙලොව අත් හළ යුතුය.
2. අධ්‍යාත්මය සඳහා මෙලොව යොදා ගත යුතුය.
3. මෙලෝ කටයුතුවල වැඩිපුර යෙදිය යුතුය.
4. මෙලොව සඳහා අධ්‍යාත්මය සොයා ගත යුතුය.

25. පහත සඳහන් ඒවායින් ෆර්ල් කිෆායා වූ ක්‍රියාවක් වන්නේ,

1. පස්වේලේ සලාතයයි. 2. සමාජ සුභසාධක ක්‍රියාකාරකම් වේ.
3. හජ් නැමදුමයි. 4. රමළාන් උපවාසයයි.

26. සව්මය අනිවාර්ය කරන ලද වසර,

1. හිජ්රි වර්ෂ 1 2. හිජ්රි වර්ෂ 3 3. හිජ්රි වර්ෂ 2 4. හිජ්රි වර්ෂ 4

27. කලීෆා අබූබක්කර් රලියල්ලාහු අන්හු තුමාගේ යෝජනාව පරිදි අල් කුර්ආනය ගොනු කිරීමේ කාර්යයේ යෙදී සිටි සහාබිවරයා,

1. අබූබක්කර් රලියල්ලාහු අන්හු 2. ඉබ්නු සාබිත් රලියල්ලාහු අන්හු
3. උස්මාන් රලියල්ලාහු අන්හු 4. ඉබ්නු මස්ඌද් රලියල්ලාහු අන්හු

28. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා මක්කාවේ ජීවත් වූ කාලය,

1. අවුරුදු 25 යි. 2. අවුරුදු 30 යි. 3. අවුරුදු 64 යි. 4. අවුරුදු 53 යි.

29. පොළොව සශ්‍රීක කරන ක්‍රියාවක් වන්නේ

1. ඉමාරත් 2. කිලාෆත් 3. දඃවාව 4. රිසාලත්

30. අභාවයට පත් සැමියා වෙනුවෙන් ඉද්දා සිටිය යුතු කාල සීමාව,

1. මාස 3 කි. 2. මාස 4 කි. 3. මාස 3 දින 10 කි. 4. මාස4 දින 10කි.

31. ඉස්ලාමීය පාලනයේ දෙවන කලීෆා වරයා වන්නේ,

1. අබූබක්කර් රලියල්ලාහු අන්හු 2. උමර් රලියල්ලාහු අන්හු

3. උස්මාන් රලියල්ලාහු අන්හු 4. අලි රලියල්ලාහු අන්හු

32. ගින්නෙන් දර දැවෙන්නා සේ යහපත් ක්‍රියා සියල්ල දවා දමන ක්‍රියාවක් වන්නේ,

1. කෝපය 2. ඊර්ෂ්‍යාව 3. අනවශ්‍ය සැකය 4. අහංකාරකම

33. අල්ලාහ් අනුමත කළ කරුණු වලින් ඔහුට ඉතාමත් පිළිකුල් වූ ක්‍රියාව,

1. තලාක් 2. බිද්අත් 3. ෂිර්ක් 4. ඉද්දා

34. ඉස්ලාමීය කාන්තාවන්ට ලබා දී ඇති අයිතිවාසිකම්,

1. සටන් තුලින් ලබා ගත් ඒවා 2. මුස්ලිම් කාන්තාවන් විසින් ලබා ගත් ඒවා

3. අල්ලාහ් විසින් ලබා දුන් ඒවා 4. කාන්තා ප්‍රඥප්ති වලින් ලබා ගත් ඒවා

35. ශිෂ්‍ය සමාජයට යහමඟ පෙන්වීම සඳහා අවශ්‍ය වන්නේ,

1. අධ්‍යාත්මික පුහුණුව 2. ශ්‍රම පුහුණුව 3. ආයුධ පුහුණුව 4. යුධ පුහුණුව

36. මුස්ලිම්වරයෙක් තම සියලු ක්‍රියා අල්ලාහ්ට භාර කිරීම,

1. රිලා 2. කව්ෆ් 3. තවක්කුල් 4. මුස්නද්

37. සෑම මසකම පුර 13, 14, 15 දින හඳුන්වනු ලබන්නේ,

1. අයියාමුල් ෆීල් 2. අයියාමුත් තස්රීක් 3. අයියාමුල් සුද් 4. අයියාමුල් අරබ්

38. රමළාන් මාසයේ අවසාන දින දහය තුල ඉටු කළ යුතු විශේෂ යහ ක්‍රියාව,

1. සදකා දීම. 2. තව්බා කිරීම.

3. කියාමුල් ලෙයිල් ඉටුකිරීම. 4. ඉඃතිකාෆ් සිටීම.

39. ''මෙලොව සඳහා ඉවසීමට වඩා පරලොව සඳහා ඉවසීම් කළ යුතුය.'' මෙය,

1. හදීසය කි. 2. කුර්ආන් කියමනකි.

3. විද්වතුන්ගේ ප්‍රකාශයකි 4. ඉහත සියල්ලම වේ.

40. විසඳුමක් නොමැති ප්‍රශ්නයකට කුර්ආනය හා හදීසය උපයෝගී කරගෙන විසඳුම් යෙදීම,

1. ඉල්හාද් වේ. 2. කරාමත් වේ. 3. ඉජිතිහාද් වේ. 4. උර්ෆු නම් වේ.

***

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු තවත් ඕනෑම ප්‍රශ්න හතරක් තෝරා ප්‍රශ්න පහකට උත්තර ලියන්න.**
- **පළමුවන ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද වේ.**

## (01) කෙටි පිළිතුරු සපයන්න.

1. අජ්නබි-මහ්රම් යන වචන වල අදහස පැහැදිලි කරන්න.
2. එංගලන්තයේ සාර්තුමා සහ ජනතාව අතර ඇතිවූ ගිවිසුමේ නම ලියන්න.
3. ඉස්ලාම් පිළිගැන්වූ මානව අයිතිවාසිකම් 2ක් ලියන්න.
4. සමාජයේ වහල්භාවය නැතිකළ මූසා අලෛයිහිස්සලාම් තුමාගේ ඉතිහාසය සඳහන් සූරාවේ නම ලියන්න.
5. රාත්‍රී කාලයේදී අවසාන ලෙස ඉටු කරන සුන්නත් සලාතයේ නම ලියන්න.
6. අල් කුර්ආනයේ අනුමත කළ ඉපයීම් ක්‍රම 2ක් නම් කරන්න.
7. වෙළඳාමෙහි මූලික කරුණු මොනවා ද?
8. 'උම්මතන් වසතන්' යනුවෙන් හඳුන්වනු ලබන පදයෙහි අදහස ලියා දක්වන්න.
9. තරුණයන්ගේ ක්‍රියාකලාපය පිළිබඳව සඳහන්වන සූරාවේ නම ලියන්න.
10. ඉස්ලාමීය ව්‍යාපාර මූලික සංකල්ප 2ක් ලියන්න.

**(02)** 1. සීරාවේ වැදගත්කම පැහැදිලි කරන්න.

2. ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ වැදගත් කරුණු 3ක් ලියන්න.

3. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා අභියෝග ජයගත් ආකාරය පැහැදිලි කරන්න.

**(03)** 1. ඉස්ලාමීය ආර්ථිකයේ මූලික සංකල්ප **2ක්** නම් කරන්න.

2. ඉපයීම යාඥාවක් ලෙස සැලකීමට නම් ඉස්ලාමයේ අනුගමනය කළයුතු ක්‍රියාවන් නම් කරන්න.

3. ඉපයීමට අදාළ ෂරීආ නීතිරීති පැහැදිලි කරන්න.

**(04)** 1. ෆර්ලු කිෆායා වූ ක්‍රියාවන් **2ක්** ලියන්න.

2. සලාතයෙන් අනතුරුව උසුරිය යුතු පාරායනයන් **3ක්** ලියන්න.

3. සලාතය ඉටුකිරීම පැහැර හැරීම නිසා ඇතිවන ප්‍රතිවිපාක සඳහන් කරන්න.

**(05)** 1. යහගුණාංග සඳහා භාවිතා වන නම් **2ක්** ලියන්න.

2. තව්බා කරනවිට පිළිපැදිය යුතු ක්‍රමවේද **3ක්** ලියන්න.

3. දන් දීමේ නිරත වන විට ඇති ප්‍රයෝජන **5ක්** ලියන්න.

**(06)** 1. මාඋන් කලීල් සහ කසීර් පැහැදිලි කරන්න.

2. සේවයක් සේ සලකන රැකියා **3ක්** ලියන්න.

3. පිරිසිදුකම ගැන හදීසියක් ලියන්න.

**(07)** 1. වහී වර්ග **2ක්** නම් කරන්න.

2. සූරතුල් ලුක්මාන්හි සඳහන් යහගුණාංග **5ක්** ලියන්න.

3. යහගුණාංග පිළිපැදීමෙන් අතිවිය හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

**(08)** **පහත සඳහන් මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.**

1. නජීස් වර්ග
2. සලාතයේ ප්‍රයෝජන
3. ඉස්ලාම් පිළිගැන්වූ මානව අයිතිවාසිකම් පිළිබඳ විස්තර කරන්න.

***